# "පමත්ත" "පමාද" යන වචන ව්‍යවහාරයන්හි පැණෙන දාර්ශනික හරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කන්දෙගෙදර සුනීතරතන හිමි[1]

පෙළ දහමෙහි පැණෙන "පමත්ත" හා "පමාද" යන ව්‍යවහාරයන් බොහෝ විට එකම අරුතකින් භාවිත වන බව පෙනේ. එහෙත් එම යෙදුම් අතර යම් වෙනස් බවකින් යුක්ත සබඳතාවක් පවතින බව හඳුනාගත හැකි ය. "පමත්ත" යනු "ප" පූර්ව "මත්ත" යන අතීත කෘදන්තයෙන් නිපන් පදයකි. මත්ත යන්නෙන් මත් වූ යන අරුත හැඟ වේ. පෙළ දහමේ දක්වෙන "මත්තගජින්ද විලාසිත ගාමී" යන සඳහනින් එය සනාථ වේ. "මත්ත" යන අතීත කෘදන්තයට පූර්වයෙන් "ප" උපසර්ගය යෙදීම හේතුවෙන් "මත්ත" යන්නෙහි අර්ථය තීව්‍ර වන අතර අතිශයින් මත් වූ යන අරුත හැඟ වේ. අධිකව මත්ද්‍රව්‍යය භාවිත කළවුන්ට ඇත්ත නැත්ත නොදැනෙන කළ යුත්ත නොකළ යුත්ත නොවැටහෙන තමා ම ලොව ශ්‍රේෂ්ඨයා ය, උගතා ය, නැණවතා ය ආදී වශයෙන් හැඟෙන සම්මෝහයෙන් යුත් උඩඟු බවක් ඇති වේ. එයට මත යැයි ද මද යැයි ද කියනු ලැබේ. පුද්ගල මත් බවට හේතු වන භෞතික සාධක කිහිපයකි. එනම් සුරා සහ මේරයයි. සුරා යනු සකස් කර ගන්නා ලද පෙරා ගන්නා ලද පාන වර්ගය. දීඝනිකායට්ඨකථා සිගාලසුත්ත වණ්ණනාවෙහි දක්වෙන අන්දමට සුරා වර්ග පහකි. පිට්ඨ සුරා, පූව සුරා, ඕදන සුරා, කිණ්ණපක්ඛිත්ත, සම්භාරසංයුත්ත යනුවෙනි. මේරය හෙවත් ස්වභාවික මල් පැණි ආදියෙන් සකසා ගන්නා ලද පාන වර්ග පහකි. ඒවා නම් පුප්ඵාසව, ඵලාසව, මධ්වාසව, ගුළාසව, සම්භාරසංයුත්ත යනුවෙනි. මේ සියල්ල ම පුද්ගල මදයට හේතු වන බැවින් මද්‍ය නම් වේ. පමත්ත යනු මෙකී සුරාවෙන් සහ මේරයෙන් මත්වීම පමණක් නොව ජාති මද, ගොත්ත මද, ආරෝග්‍ය මද, යොබ්බන මද, ජීවිත මද, ලාභ මද, සක්කාර මද, ගරුකාර මද, පරිවාර මද, භෝග මද, වණ්ණ මද ආදී සත්විසි මදයෙන් මත් බවට පත්වීමයි. එසේ මත් බවට පත් වීමෙන් පුද්ගලයා ප්‍රමාදයට පත් වේ. එනම් පමත්ත හේතුවෙන් පමාද තත්ත්වයට පත් වේ.

සාමාන්‍ය ජන ව්‍යවහාරයෙහි දක්වෙන ලෙසට ප්‍රමාද යන වචනයෙන් කියවෙන්නේ යම් කිසි කාර්යයක් කළ යුතු අවස්ථාවේ දී කළ නොහැකි වීම හා නොකර හැරීම යි. දහමට අනුව පමාද යනු කුසලයට සිත යොමු නොකොට කාම වස්තූන් කෙරෙහි ආසක්තව කටයුතු කරමින් නිවනට ප්‍රමාද වීමයි. පමාදය සිදු වන්නේ සත්විසි මදයන්ගෙන් මත්වීම හේතුවෙනි. පමත්ත හෙවත් අතිශයින් මත් වීමෙන් විනිර්මුක්ත වීම මගින් පමාදයෙන් මිදී අප්පමත්ත තත්ත්වයට පත් වේ.

ප්‍රමුඛ පද - පමත්ත, පමාද, මජ්ජ, සුරාමේරය

1 පරිවේණාචාර්ය, ශ්‍රී සම්බුද්ධ ජයන්ති දක්ෂිණාරාම පිරිවෙණ, හෝකන්දර
Email - Ksuneetharathana@yahoo.com